**<u>මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ</u>**
**<u>සම්මුඛ පරීක්ෂණයේ ලකුණු නිර්ණායක</u>**

<table>
<tr><th></th><th>ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන්</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>01.<br>ජ්‍යෙෂ්ඨත්වය<br>ලකුණු 30</td><td>01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලයක් සහිතව II සහ III ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සළකා, සම්පූර්ණ කර ඇති මුළු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>ලකුණු 30</td></tr>
<tr><td rowspan="4">02.<br>කුසලතාවය<br>ලකුණු 70</td><td><u>02.1. කාර්යය සාධන ඇගයුම්</u><br>අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>(වසරකට ලකුණු 02 බැගින් වසර 05ක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 10)
<table>
<tr><td>විශිෂ්ටයි</td><td>ලකුණු 02</td></tr>
<tr><td>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ</td><td>ලකුණු 1.5</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 01</td></tr>
</table></td><td>ලකුණු 10</td></tr>
<tr><td><u>02.2. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද</u><br><br>අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>02.2.1. පාසැල් කළමනාකරණයේ පළපුරුද්ද - (ලකුණු 04)<br>( ශ්‍රී.ලං.අ.ප.සේ. සඳහා අනුමත I ශ්‍රේණියේ විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 01 බැගින්)<br>02.2.2. කාර්යාල කළමනාකරණයේ පළපුරුද්ද - (ලකුණු 06)<br>(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින් )</td><td>ලකුණු 10</td></tr>
<tr><td><u>02.3. අධ්‍යාපන සුදුසුකම්</u><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්
<table>
<tr><td>02.3.1. දර්ශනශූරී උපාධිය (PhD)</td><td>ලකුණු 10</td></tr>
<tr><td>02.3.2. දර්ශනපති උපාධිය (M Phil)</td><td>ලකුණු 07</td></tr>
<tr><td>02.2.3. පළමු පංතියට/ශ්‍රේණියට උසස්වීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධිය (MA, MSc, MBA වැනි)</td><td>ලකුණු 05</td></tr>
<tr><td>02.3.4. කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස්කිරීම සඳහා සළකා නොබැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව</td><td>ලකුණු 03</td></tr>
<tr><td>02.3.5. සේවයට බඳවා ගැනීමට සුදුසුකම වූ ප්‍රථම උපාධියට අමතරව ලබා ඇති ප්‍රථම උපාධිය ( උදා -: LLB, BIT වැනි )</td><td>ලකුණු 02</td></tr>
</table>
(මෙහිදී බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස සැලකූ උපාධිය, කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම හා ශ්‍රේණි උසස් කිරීම් සඳහා සලකා බැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ පශ්චාත් උපාධි හැර, අනෙකුත් සුදුසුකම් අතරින්, එක් එක් ක්ෂේත්‍රයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)</td><td>ලකුණු 10</td></tr>
<tr><td><u>02.4. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය</u><br><br><u>02.4.1. වෘත්තිය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ</u><br>(පශ්චාත් උපාධියට/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, වෘත්තිය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 05 බැගින් උපරිම පර්යේෂණ 02 ක් සඳහා ලකුණු දෙනු ලැබේ.)</td><td>ලකුණු 10</td></tr>
</table>

02.4.2. ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මඟින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරාවල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම සුදුසුයැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා එක් ප්‍රකාශනයකට ලකුණු 2.5 බැගින් උපරිම ප්‍රකාශන 02 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. )

**02.5. පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනුම** — **ලකුණු 05**

02.5.1. උපාධිය /උපාධියේ ප්‍රධාන විෂයයක්/පශ්චාත් උපාධි ලකුණු - 05
02.5.2. මාස 06 ට වැඩි සහතික පත්‍ර /පුහුණු පාඨමාලා /ඩිප්ලෝමා ලකුණු - 04
02.5.3. මාස 03 කට වැඩි මාස 06 දක්වා සහතික පත්‍ර/ පුහුණු පාඨමාලා/ ඩිප්ලෝමා ලකුණු - 03
02.5.4. සති 02 කට වැඩි මාස 03 දක්වා සහතික පත්‍ර /පුහුණු පාඨමාලා ලකුණු - 02

**(මෙහිදී ඉහළම සහතිකයට පමණක් ලකුණු දෙනු ලැබේ.)**

**02.6. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව** — **ලකුණු 05**

02.6.1. ඉංග්‍රීසි විෂය සහිත උපාධි / ඉංග්‍රීසි මාධ්‍ය උපාධි / ඉංග්‍රීසි මාධ්‍ය පශ්චාත් උපාධි (ලකුණු - 05)
02.6.2. අ.පො.ස.(උ.පෙළ) ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම (ලකුණු - 04)
02.6.3. වසරක කාලයකට වැඩි ඩිප්ලෝමා පාඨමාලා (ලකුණු - 03)
02.6.4. මාස 06 හෝ ඊට වැඩි, අවු 1 ට අඩු ඩිප්ලෝමා / සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 02)
02.6.5. මාස 06 ට අඩු - සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 01)

**(මෙහිදී ඉහළම සහතිකයට පමණක් ලකුණු දෙනු ලැබේ.)**

**02.7. සේවා ඇගයීම් /ප්‍රශංසා සහතික(පොදු 230 බී ආකෘතිය) /සම්මාන සහතික /ජයග්‍රහණ** — **ලකුණු 05**

02.7.1. ජාතික මට්ටම (ලකුණු 05 බැගින් 01 ක් සඳහා )
02.7.2. පළාත් මට්ටම (ලකුණු 02 බැගින් 02 ක් පමණක් සළකා බැලේ )
02.7.3. කලාප මට්ටම (ලකුණු 01 බැගින් 02 ක් පමණක් සළකා බැලේ )
02.7.4. ප්‍රශංසා සහතික (ලකුණු 01 බැගින් උපරිම 02 ක් පමණක් සළකා බැලේ )

(මෙහිදී අදාළ වන ලේඛන පෞද්ගලික ලිපි ගොනුව අනුව වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)

**02.8. තනතුරට අදාළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය සම්බන්ධ ඉදිරිපත් කිරීම** — **ලකුණු 10**

02.8.1. ප්‍රවේශය (ලකුණු - 02)
02.8.2. ඉදිරිපත් කරන කරුණු (ලකුණු - 02)
02.8.3. ඉදිරිපත් කිරීමේ විලාශය (ලකුණු - 02)
02.8.4. කාල කළමනාකරණය (ලකුණු - 02)
02.8.5. පරීක්ෂණ මණ්ඩලය යොමු කරනු ලබන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාරය (ලකුණු - 02)

**(මෙහිදී නිලධාරියා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතියට ඉටුකරන ලද රාජකාරීන් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය සම්බන්ධ කරුණු ඇතුළත් කරමින් පරිගණක ආශ්‍රයෙන් (Power Point Presentation) කරනු ලබන විනාඩි 10ක නිර්මාණශීලී ඉදිරිපත් කිරීමක් සිදු කළයුතු වේ)**

**02.9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය** — **ලකුණු 05**

| | |
|---|---|
| නායකත්වය හා පෞරුෂය | ලකුණු 02 |
| සන්නිවේදන හැකියාව | ලකුණු 02 |
| ආකල්ප | ලකුණු 01 |

**මුළු ලකුණු** — **ලකුණු 100**